# ළමාවිය පිළිකා යනු කුමක්ද?

**පිළිකා යනු කුමක්ද?**

අපගේ සිරුරේ සියළුම අවයව සහ පටක සෑදී ඇති මූලික ඒකකය සෛලයවේ. පිළිකාව යනු සිරුරේ ඇති සෛල පාලනය කල නොහැකි ආකාරයකට වර්ධනය වන රෝගයකි. වර්ධනයවී බෙදිය නොයුතු අවස්ථාවලදී පිළිකා සෛල වර්ධනයවී බෙදෙන අතර අවශ්‍ය කාලයට වඩා වැඩි කාලයක් ඒවා ජීවත්වේ. පිළිකා සෛල සාමාන්‍ය සෛලවල ස්ථානය ගත හැක. පිළිකා සෛල සමූහයක් ටියුමරයක් ලෙස හඳුන්වයි. එක් එක් පිළිකා වර්ගයට වෙන වෙන නම්, විවිධ ප්‍රතිකාර සහ විවිධ සුවවීමේ අවස්ථා ඇත.

**ළමාවිය පිළිකා වැඩිහිටි පිළිකාවලින් වෙනස් වන්නේ කෙසේද?**

වැඩිහිටි පිළිකා ඇතිකරන දුම්පානය සහ රසායනික ද්‍රව්‍ය ආදිය පැහැදිලිවම ළමුන්ගේ පිළිකාවලට හේතු නොවේ. ළමුන්ගේ පිළිකා වැඩිහිටියන්ගේ පිළිකාවලට වඩා ශරීරයේ වෙනස් ස්ථානවල ඇතිවන අතර වැඩිහිටියන්ට වඩා අඩු වශයෙන් ඇතිවේ. වැඩිහිටි පිළිකා ඇතිවන වඩා සුලභ ආකාර වන්නේ සම, පියයුරු, පුරස්ථ, පෙනහළු සහ බඩවැල ආදියවේ. ළමුන් අතරේ වඩාත්ම සුලභ ආකාර පිළිකාවන්නේ රුධිරය සහ ඇට මිදුළු, වසා පටක, මොළය, ස්නායු පද්ධතිය, මාංශපේශි, වකුගඩු සහ ඇට ආදියවේ. වැඩිහිටියන් අතරේ ඇති පිළිකාවලට වඩා ළමුන් අතරේ ඇති පිළිකා, ප්‍රතිකාරවලට වඩා හොඳ ප්‍රතිචාර දක්වන අතර ළමුන් අතර සුවවීමේ අනුපාතය වැඩිහිටියන් අතරට වඩා බොහෝ වැඩිය.

**ළමාවිය පිළිකාවලට හේතු මොනවාද?**

බොහෝ දෙමාපියන් සිය දරුවන්ගේ පිළිකාවලට හේතුව කුමක්ද යන්න දැනගැනීමට විමතියෙන් සිටී. ඔවුන්ට ඇති බිය වන්නේ ඔවුන් විසින් කල හෝ නොකල යම් දෙයක් මගින් රෝගය ඇතිවුණිද යන්නයි. අප දන්නා ආකාරයට දෙමාපියන් හෝ දරුවන් විසින් කල කිසිදු දෙයක් මගින් පිළිකා ඇතිවීම හෝ වැළැක්වීම සිදු කල නොහැක. ඔබට වෙනත් අයෙකු මගින් පිළිකාවක් බෝවිය නොහැක. බොහෝ ළමාවිය පිළිකාවලට නිශ්චිත හේතුව අප නොදන්නා නමුදු විද්‍යාඥයන් විසින් අදාල හේතුන් සෙවීමට උත්සාහ දරමින් සිටී. ළමාවිය පිළිකා ඉතා කුඩා ප්‍රමාණයක් ප්‍රවේණියෙන් (දෙමාපියන්ගෙන් දරුවන්ට ලැබේ) පැමිණේ. ඔබගේ දරුවාගේ පිළිකාව කුමන ආකාරයට ඇතිවුණිද යන්න කුමන හෝ සිතිවිල්ලක් හෝ කණස්සල්ලක් ඇතිනම්, ඔබ ඔබගේ වෛද්‍යවරයා හෝ හෙදිය සමඟ කථාකල යුතුය.

**වගකීමෙන් බැහැරවීම:** අධ්‍යාපනය සහ තොරතුරු සඳහා පමණි. ප්‍රකාශනය පලකරන අවස්ථාවේ මෙහි අඩංගුදේ නිවැරදිවේ. කෙසේවුවද, කාලයක් පුරා තොරතුරු වෙනස්විය හැකිය. ඔබගේ වෛද්‍ය ප්‍රශ්න සඳහා සැමවිටම ඔබගේ සෞඛ්‍යය රැකවරණ කණ්ඩායමෙන් උපදෙස් ලබාගන්න.

සම්බන්ධීකරණය සහ පහසුකම් සැලසීම The Royal Children’s Hospital, Monash Children’s – Southern Health and The Peter MacCallum Cancer Centre හි Paediatric Integrated Cancer Service for the Children’s Cancer Centre මගිනි. **2011 සැප්තැම්බර්**

Paediatric Integrated Cancer Service
A statewide cancer service for children